www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

තෙල් කුමන්ත්‍රන සහ එක්සත් ජනපදයේ "යථාවාදී දේශපාලනය" කොකේසියාව තුල ආතතීන් ඉහල නංවයි

# ජෝර්ජියාවේ "රෝස විප්ලවය" : ඇමරිකාවේ නිෂ්පාදිත කුමන්ත්‍රනයක්

***Oil intrigue and US Realpolitik heighten tensions in the Caucasus***

Georgia's "rose revolution": a made-in-America coup

**බැරී ග්‍රේ සහ ව්ලැදිමීර් වොල්කොව් විසිනි**
**2003 දෙසැම්බර් 05**

මූලෝපායිකව වැදගත්, ජෝර්ජියාවේ කොකේසියානු ජාතිය තුල පාලන තන්ත්‍ර වෙනසක්, සාර්ථකව ක්‍රියාත්මක කල එක්සත් ජනපදය, කලාපයේ සිය ප්‍රමුඛ ප්‍රතිවාදියා වන, රුසියාවට වඩා වාසි ලැබීම අරමුනු කර ගත්, පියවර මාලාවක් ගෙන ඇත.

පැරනි සෝවියට් සමූහාන්ඩුවේ ජනාධිපති, එඩුවාඩ් ෂෙවඩ්නාඩ්සේ තනතුරෙන් ඉල්ලා අස්වීමෙන් දින 09කට පසුව, ඔක්තෝබර් 2 දා එක්සත් ජනපද හිතවාදී ඔහුගේ අනුප්‍රාප්තිකයන් රුසියාව ප්‍රසිද්ධියේ විවේචනය කිරීමට හා එහි හමුදාවන් ජෝර්ජියාවෙන් සහ තවත් පැරනි සෝවියට් ප්‍රදේශයක් වන මෝල්ඩොවාවෙන්, ඉවත් කර ගන්නා ලෙසට බල කිරීම සඳහා, ඇමරිකානු රාජ්‍ය ලේකම් කොලින් පවෙල් සමග එක් වූහ. මොස්කව් හා වොෂින්ටනය අතර විවෘත ගැටුම හටගත්තේ, ඕලන්ද නගරයක් වන මාස්ට්‍රිච්ට්හි පැවති, යුරෝපීය ආරක්ෂක හා සහයෝගිතා සංවිධානයේ (ඕඑස්සීඊ) වාර්ෂික සමුලුවේ දී ය.

කැඩී ගිය මෝල්ඩෝවා ප්‍රදේශයෙහි වසර 2020 දක්වා හමුදා රඳවා තැබීමේ රුසියානු සැලැස්ම, ප්‍රතික්ෂේප කිරීමට ඇමරිකානු නියෝජිතයන් සහ අනෙකුන් මෝල්ඩොවා වේ ජනාධිපති එකඟ කර ගත්හ. රුසියාව සිය හමුදා, ජෝර්ජියාවෙන් ඉවත් කර ගත යුතු බව ප්‍රකාශ කල පවෙල් කොකේසියානු අසල්වැසියාගේ දකුනට වන්නට පිහිටි කැරලිකාර ප්‍රදේශ ගනනාවක, බෙදුම්වාදී නායකයන්ට සහාය දැක්වීම ගැන, මොස්කව් වෙත අනතුරු ඇඟවී ය.

ජෝර්ජියාවේ අන්තර්වාර ජනාධිපති වන පාර්ලිමේන්තුවේ හිටපු කතානායක නිනෝ බර්ඩ්හැනාඩ්සේ, රුසියානු විදේශ ඇමති ඉගෝර් ඉවානෝව් හමුවීමෙන් පසුව රුසියානු නායකයා හෙලාදකිමින්, "මොස්කෝව ජෝර්ජියාව සමඟ නව සබඳතාවන් ඇරඹීමට සූදානම්ව" නො සිටියේ යැයි මැසිවිලි නැගුවා ය.

මොස්කෝව කෙරෙහි වොෂින්ටනයේ ආක්‍රමනශීලි ආස්ථානය, දෙසැම්බර් 5 දා එක්සත් ජනපද ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ්, ජෝර්ජියානු අගනුවර වන ටිබිලිසි වෙත පැමිනෙන බව ප්‍රකාශයට පත්කිරීමත් සමග සම්පාත විය. ඔහුගේ පැමිනීම ජෝර්ජියාවේ නව පාලකයන් වෙත සහයෝගය පලකිරීමට වඩා වැඩි දෙයකි. ටිබිලිසිහි නවපාලන තන්ත්‍රය හා කැඩී ගිය ප්‍රාන්තයන් වන, අබ්හාසියා, උතුරේ දකුනු ඔටේසියා හා දකුනේ අජාරා ද අතර, මිලිටරි ගැටුම් හටගැනීමේ හැකියාව ගැන ඇඟවුම්වලින් පසුව, මෙය සිදුවෙයි.

පසු ගිය සතියේ රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් මොස්කව්හි දී මෙම ප්‍රාන්ත තුනෙහි නායකයන් සමග සාකච්ඡාවලට සහභාගි වූ අතර, අජාරාහි ඇස්ලාන් ඇබෂිඩ්සේ ප්‍රකාශ කලේ, ටිබිලිසිහි ආක්‍රමනික ක්‍රියා වැලැක්වීමෙහි ලා කලු මුහුදේ බටුම් වරායෙහි රඳවා ඇති, රුසියානු හමුදාවන් මත විශ්වාසය තැබිය හැකි බව යි. නව පාලන තන්ත්‍රය පිලිගැනීම ප්‍රතික්ෂේප කල ඇබෂිඩ්සේ, ජෝර්ජියා-අජාරා දේශසීමාව වසා දැමූ අතර, ජනවාරි 4 දාට නියමිත, ජෝර්ජියානු පාර්ලිමේන්තු හා ජනාධිපති මැතිවරන වර්ජනය කරන බවට, තර්ජනය කලේ ය.

නොවැම්බර් 22-23 සති අන්තයේ දී බලය අල්ලාගත්, එක්සත් ජනපද හිතවාදී බලවේගයන්, වඩාත් කැපී පෙනෙන කැරලි නායකයා හා ටිබිලිසිහි නගරාධිපති ද වන, මිහායල් සකාෂ්විලි වටා ඒකරාශීවීමේ තතු තුල, මෙම මැතිවරන තරමක් දුරට සාමාන්‍ය තත්වය ඉක්මවා යනු ඇත.

සතිය මුල දී, ජනාධිපති ජෝර්ජ් බුෂ් වැඩබලන ජනාධිපති බර්ඩ්හනාඩ්සේට දුරකථනයෙන් කතා කර, අවශ්‍ය වුවහොත් ජෝර්ජියාවේ - එක්සත් ජනපද ජාතික ආරක්ෂක මන්ඩලයේ ප්‍රකාශකයාට අනුව - "ස්වෛරීත්වය, නිදහස හා භෞමික අඛන්ඩතාව ය" තහවුරු කිරීමට මැදිහත් වන බවට, පොරොන්දු විය.

## මහබලවතුන්ගේ කුටෝපායන්ගේ නාභිගතවීමක්

එක්සත් ජනපද සහාය ලද, ජෝර්ජියාවේ කුමන්ත්‍රනය හා වොෂින්ටනයේ රාජ්‍ය තාන්ත්‍රික යුද

තර්ජනයන්, ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාප්ත කිරීම හෝ ඒ හා සමාන දෙයකට කිසිදු සම්බන්ධයක් නැත. කලු මුහුද හා තෙල් බහුල කැස්පියන් මුහුද අතර, මූලෝපායිකව පිහිටා ඇති ජෝර්ජියාව මහබලවතුන් අතර දිගු කලක් තිස්සේ පවතින කුමන්ත්‍රන හා ගැටුම්වලට හේතු වී ඇත. සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසුව, ජෝර්ජියාව ඇතුලු කොකේසියානු කලාපයේ, රුසියන් බලපෑම දුබල කර, එක්සත් ජනපද ආධිපත්‍ය පිහිටුවීම, එක්සත් ජනපද අධිරාජ්‍යවාදී පිලිවෙතේ පැලපදියම්ව ඇති කේන්ද්‍රීය අරමුන බවට, පත්ව තිබේ.

ක්ලින්ටන් පරිපාලනයේ මුල් දිනවල පටන් ම, රුසියාව හා ඉරානය යන දෙරටේ ම භූමිභාගයන් වටා අසර්බයිජානයේ බාකු තෙල් බිම්, බටහිර වෙලඳ පොලවලට සම්බන්ධ කරන, නල මාර්ග ඉදිකිරීමට වොෂින්ටනය දැවැන්ත දේශපාලන හා රාජ්‍යතාන්ත්‍රික ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබේ. එවන් නල මාර්ගයක් ගමන් කල යුත්තේ අස්ථාවර පසුගාමී හා වාර්ගිකව ඉරීගිය රටක් හරහා වීම හේතුවෙන් ජෝර්ජියාව වඩාත් තීරනාත්මක වී තිබේ.

බාකු සිට මධ්‍යධරනී තුර්කි වරායක් වන සීහාන් තෙක් දිවෙන තෙල් නල පද්ධතිය, 2005 වසරේ දී විවෘත කිරීමට නියමිත ය. ජෝර්ජියාව තුල සාපේක්ෂ ස්ථාවරත්වයක් පවත්වා ගත හැකි. ව්‍යවස්ථාදායක එක්සත් ජනපද හිතවාදී තන්ත්‍රයක් විසින්, එය පාලනය කිරීම, වොෂින්ටනයට දැවැන්ත හදිසිභාවයකින් යුක්ත කාරනයකි. එක්සත් ජනපද බලශක්ති සමාගම්වල අවශ්‍යතාවන් ද, සමස්තයක් ලෙස ඇමරිකානු අධිරාජ්‍යවාදයේ, භූගෝලීය මිලිටරි හා මූලෝපායික ඉලක්කයන් ද, මෙම ප්‍රශ්නය මත කැටි වී තිබේ. පසුගිය මාසයේ ෂෙවඩ්නාඩ්සේ බලයෙන් පහකල ඊනියා "රෝස විප්ලවයේ" මූලයන් වැටී ඇත්තේ මෙහි ය.

කුමන්ත්‍රනයෙන් පසුව, ජෝර්ජියාවට සැපත් වන එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ, අධිකරන දෙපාර්තමේන්තුවේ, භාන්ඩාගාරයේ හා පෙන්ටගනයේ නිලධරයන් රාශිය අතුරෙන්, රම්ස්ෆෙල්ඩ් ඉහල ම පැතිකඩ පමනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ලෝක බැංකුවේ හා වෙනත් මූල්‍ය ආයතනවල නියෝජිතයෝ ද එහි යමින් සිටිති.

ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ ද, එක්සත් ජනපද ආන්ඩුවේ ද, නියෝජිතයෝ එහි දී තමන්ට මිත්‍රශීලී ප්‍රතිචාරයක් ලැබෙනු ඇතැයි විශ්වාසයෙන් පසුවෙති. අවසාන වසයෙන් ෂෙවඩ්නාඩ්සේ බලයෙන් පහකල පෙලපාලි හා විරෝධතා ව්‍යාපාරය තුල පෙල ගැසුනු බලවේගයන්, ඍජුව ම වොෂින්ටන් කඳවුරේ පිහිටා සිටින අතර, වෝල් වීදිය හා බුෂ් පරිපාලනය අනුග්‍රහය දක්වන, "නිදහස් වෙලඳ පොල" ආර්ථික පිලිවෙත් උද්යෝගිමත්ව වැලඳගන්නවුන් ය.

මෙම "විප්ලවවාදීන්" ගේ හා "ප්‍රජාතන්ත්‍රවාදීන්"ගේ ඇමරිකාවේ නිෂ්පාදිත පැටිකිරිය, හුදෙක් දේශපාලන හා දෘෂ්ටිමය නැදෑකම් ඉක්මවා යයි. ෂෙවඩ්නාඩ්සේ බලයෙන් නෙරපා හැරීමට සම්බන්ධ වූ ප්‍රමුඛ සංවිධාන හා පුද්ගලයන් වනාහි, එක්සත් ජනපද ආන්ඩුවට සම්බන්ධ ආයතනවල මුදලින් හා ඒවායේ වෙනත් බටහිර අනුග්‍රාහකයන් විසින්, යුගෝස්ලාවියානු ජනාධිපති ස්ලොබොඩාන් මිලොසෙවික් බලයෙන් පහකල ආකාරයේ, "විප්ලවයන්" කිරීමට පුහුනු කරනු ලැබූවන් ය.

## කල්පසු වූ "ප්‍රජාතන්ත්‍රවාදීන්"

මිහායල් සකාෂ්විලි, නිනෝ බඩ්හැනාඩ්සේ, හා සුරාබ් ස්වානියා යන නව පාලක කල්ලියේ වඩාත් කැපී පෙනෙන දේශපාලනඥයන් තිදෙනා ම ෂෙවඩ්නාඩ්සේගේ කිට්ටුවන්තයෝ වූහ. හිටපු පාලකයාගේ පාලනයෙහි අංග ලක්ෂන ලෙස පැවති දූෂනය, ඉහලින් කෙරෙන කුමන්ත්‍රනයට විරුද්ධ ඔවුන්ගේ පිලිකුල, ප්‍රජාතන්ත්‍රවාදය කෙරේ ඔවුන්ගේ ලැදියාව ලෙස දැක්වේ.

ජෝර්ජියානු ජනාධිපතිකමට, ඉවත් නො කල හැකි උරුමකරු වන 35 හැවිරිදි මිහායල් සකාෂ්විලි, වොෂින්ටන් ඩීසී හි ජෝර්ජ් වොෂින්ටන් විශ්වවිද්‍යාලයේ හා නිව්යෝර්ක්හි, කොලොම්බියානු නීති විශ්වවිද්‍යාලයේ ද, උපාධිධරයෙකි. ෂෙවඩ්නාඩ්සේගේ අධිකරන ඇමති වසයෙන් ඔහු 1990 ගනන් මැද දී සෝවියට් යුගයේ විනිසුරුවන් විරේක කිරීම අධීක්ෂනය කලේ ය. මෙම ක්‍රියාවලිය ටිබිලිසිහි එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින්, ඇමරිකානු නීතිඥ සංගමයේ සහාය මත සම්බන්ධීකරනය කල බව වාර්තා විය.

මෑත මාසවල දී, සාකාෂ්විලී තමන්ම සිය පූර්ව දේශපාලන ගුරුවරයාගෙන් දුරස්ථ විය. ග්‍රීෂ්මයේ පැවති ප්‍රාදේශීය මැතිවරනවල දී විරුද්ධවාදියෙකු ලෙස තරඟ කල ඔහු ටිබිලිසි නගරාධිපති ලෙස තේරී පත්විය.

පාර්ලිමේන්තු කතානායක, පනස් වියැති නිනෝ බර්ඩ්හැනාඩ්සේ, ෂෙවනාඩ්සේගෙන් කැඩී ගියේ, පසුගිය අගෝස්තුවේ එක්සත් ජනපද ඒඊඑස් බලශක්ති සමාගම, ජෝර්ජියාවෙන් ඉවත්වීම මුල්කර ගෙන ය. ඇමරිකානු සමාගම ජෝර්ජියාව තුල තම මෙහෙයුම රුසියානු රාජ්‍ය බලශක්ති සමාගමට විකුනා ඇමුවේ, සැලකිය යුතු පාඩු ලබමිනි.

හිටපු පරිසරවේදියකු වන සුරාබ් ෂ්වානියා, ෂෙවඩ්නාඩ්සේගේ 1990 ගනන්වල "ප්‍රතිසංස්කරන" කන්ඩායමේ සම්බන්ධීකරන නිලධාරියා ය.

පසුගිය නොවැම්බර් 2 දා පැවැත්වූ, පාර්ලිමේන්තු මැතිවරනවලින් පසුව දියත් වූ විරෝධතාවන්ගේ මුදුනට, සකාෂ්විලි පැමිනියේ ය. ෂෙවඩ්නාඩ්සේට ජය ගෙන දුන් නිල ප්‍රතිඵල ප්‍රෝඩාකාරී බව පෙනී ගියේ ය. (පාලන තන්ත්‍රය හොර ඡන්ද දැමීම් හා ඡන්ද පෙට්ටි පිරවීමෙන් නිරතව සිටි බවට ඇත්තේ සුලු සැකයක් නමුදු අවසන් ඡන්ද ඡන්ද මංකොල්ලයක් වූ බවට වර්ධනය වූ පොදු පිලිගැනීම, විරුද්ධ පක්ෂවල

ජයග්‍රහනයක් සේ පෙන්නුම් කරන ලදි. මෙම ඡන්දවලට, ඇමරිකානු රාජ්‍ය නො වන සංවිධාන හා එක්සත් ජනපද ආයතන මගින් මුදල් යොදා ඇත. ඡන්දය රස්ටාවි 2 යන, බටහිර සහාය ලබන විරුද්ධ පක්ෂවල රූපවාහිනී චැනලය මගින්, ප්‍රචාරය කරන ලදි.)

නොවැම්බර් 22 දින ෂෙවඩ්නාඩ්සේ, නව පාර්ලිමේන්තුව විවෘත කිරීමට උත්සාහ කල විට, ඔහු මුහුන පෑවේ ඡන්දය යලි ගනන් කරන ලෙස ඉල්ලා සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතා පෙලපාලිවලට ය. දහස් ගනනක් සිසුන් පිරිවරාගත් සකාෂ්විලී "ක්මාරා" හෙවත් තවත් එපා යන සටන් පාඨය යටතේ පාර්ලිමේන්තුවට කඩාවැදී, ෂෙවඩ්නාඩ්සේට නින්දිත ලෙස පලායෑමට බල කලේ ය. සාමකාමීව බලයෙන් පහකිරීම විදහා පෑමට රෝස මලක් ප්‍රදර්ශනය කරමින් සකාෂ්විලී ෂෙවඩ්නාඩ්සේ පාලනයේ මලගම නිවේදනය කලේ ය.

පසුදිනයේ දී, විරුද්ධ පක්ෂ ආධාරකරුවන් රජයේ චාන්ස්ලර් කාර්යාලය අල්ලාගත් අතර, බර්ඩ්හැනාඩ්සේ, තමා වැඩ බලන ජනාධිපති බව ප්‍රකාශ කරමින් පාර්ලිමේන්තු හා ජනාධිපති ඡන්දය දින 45ක් ඇතුලත පවත්වන බව නිවේදනය කලා ය.

ෂෙවඩ්නාඩ්සේ, කැරැල්ල මැඩීමට හමුදාව කැඳවුම් කල ද. ආරක්ෂක ඇමති එය නො තකා හල බව වාර්තා විය. මෙම අවස්ථාවේ දී ටිබිලිසි කරා පැමිනි රුසියානු විදේශ ඇමති ඉගෝර් ඉවානොව්, ෂෙවඩ්නාඩ්සේ බලයේ තබා ගැනීම සඳහා සම්මුතියක් ඇති කර ගැනීමට උත්සාහ කලේය. විරුද්ධ පක්ෂ නායකයන් මෙම යෝජනාව ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, සිවිල් යුද්ධයක් වලක්වා ගැනීම සඳාහ බලයෙන් ඉවත් වන ලෙස ඉවානොව්, ෂෙවඩ්නාඩ්සේ එකග කර ගත්තේ ය. නොවැම්බර් 23 දා ඉරු දින සවස දොලොස් වසරක ජනාධිපති මෙයට අවනත විය.

### වොෂින්ටනය ඇඹය ගලවයි

ෂෙවඩ්නාඩ්සේගේ වැටීමට තුඩු දුන් මූලික කාරනය වූයේ, වොෂින්ටනය, එහි දිගුකාලීන සහචරයාට ලබා දුන් සහයෝගය ඉවත් කර ගැනීම යි. ජෝර්ජියානු ජනාධිපති හා එක්සත් ජනපදය අතර සබඳතා පසු ගිය වසර ගනනාව තුල හීන වී තිබේ. 1998 වසරේ දී රුසියානු මූල්‍ය කඩාවැටීමෙන් පසු සිය දැවැන්ත උතුරු අසල්වැසියා මත බෙහෙවින් ම රඳා පවතින ජෝර්ජියානු ආර්ථිකයේ ස්ථාවරත්වය සහතික කර ලීමේ ලා ෂෙවඩ්නාඩ්සේ සතු හැකියාව පිලිබඳ, වොෂින්ටනයේ කනස්සල්ල ඉහල නැංවී ය. බුෂ් පරිපාලනය ස්ථාපනය වීමෙන් පසුව ෂෙවඩ්නාඩ්සේට ලැබුන එක්සත් ජනපද සහයෝගය තවදුරටත් බාදනය විය.

එක්සත් ජනපදය සිය නො නිල, එහෙත් නො සැග වූ සහාය, ඊනියා ප්‍රජාතන්ත්‍රීය විපාර්ශ්වය වෙත පලකිරීම වැඩිවත්ම, ෂෙවඩ්නාඩ්සේ, වඩාත් මොස්කෝව වෙත නැඹුරු විය.

මතභේදයට තුඩු දුන් නොවැම්බර් 2 වැනි දින පාර්ලිමේන්තු මැතිවරනය කෙරෙහි, වොෂින්ටනය මුලින් ප්‍රතිචාර දැක්වූයේ සුමුදු ලෙස ය. ප්‍රබල නීතිවිරෝධී ක්‍රියා, රාජ්‍ය දෙපාර්තමේන්තුව විස්තර කලේ "වැඩියෙන් උලුප්පා දැක්වීමක්" ලෙස ය. එහෙත් නොවැම්බර් 21 වන විට එක්සත් ජනපදය සිය ස්ථාවරයේ වෙනසක් සලකුනු කරමින් මැතිවරන ක්‍රියාවලිය පිලිබඳ තමන්ගේ "බලාපොරොත්තු සුන්වීම" ප්‍රකාශ කලේ ය.

මෙය ප්‍රතිපක්ෂ බලවේගයන් ආක්‍රමනකාරී මාවතකට ගමන් කරවීමේ සංඥාවක් විය. නොවැම්බර් 22-23 සති අන්තයේ දී කොලින් පවෙල් ෂෙවඩ්නාඩ්සේ සමග පැවැත් වූ දුරකතන සාකච්ඡා දෙකෙහිදී ම බලකර සිටියේ, ඔහු ඉල්ලා අස්විය යුතු බව යි. සකාෂ්විලී ඇතුලු කන්ඩායම බලය අල්ලා ගැනීමත් සමග ම වොෂින්ටනය කල්මැරීමකින් තොරව ම නව පාලන තන්ත්‍රයට, තම සහයෝගය ප්‍රකාශ කරමින් ද මැදිහත්වීමේ මොනයම් හෝ උත්සාහයකට එරෙහිව රුසියාවට අනතුරු අඟවමින් ද, සුභ පැතී ය.

ජෝර්ජියානු සිද්ධීන් පිලිබඳ තම සතුට සැඟවීමට උත්සාහ නො කල බුෂ් පරිපාලනයේ නිලධාරීන් අතුරින් එක් අයෙක් ප්‍රකාශ කලේ "හරියට වැඩකරන්නේ කෙසේ ද යන්න ගැන මෙය පෙලපොත් සිද්ධියක්" බව යි.

නොවැම්බර් 24 දින *වෝල්ස්ට්‍රීට් ජර්නලය* වාර්තා කල පරිදි, ඇමරිකානු නිලධාරින් සියල්ලට ම වඩා හොඳින් දැන සිටියේ "සකාෂ්විලි බර්ඩ්හැනාඩ්සේ හා ෂ්වානියා යන තිදෙනා ම සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසුව පැනනැංගා වූ රාජ්‍ය නො වන සංවිධාන රාශියක සහාය ලැබූ බව යි. ඇමරිකානු හා වෙනත් බටහිර පදනම් කරගත් ආයතනවල සහාය ලැබූ එවන් බොහෝ සංවිධාන, බටහිර ගැති ප්‍රතිසංස්කරන සඳහා පිපාසයෙන් පෙලෙන, ඉංග්‍රීසි කතාකරන, තරුන, බුද්ධිමතුන් ස්ථරයක් ජනනය කර තිබේ."

ඒවා අතර ප්‍රමුඛ රාජ්‍ය නො වන සංවිධාන වන විමුක්ති ආයතනය, එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ යුරේෂියා පදනම් ආයතනයේ ද, මූල්‍ය ඒජන්තයෙකු වන ජෝර්ජ් සොරෝස්ගේ විවෘත සමාජ ආයතනයේ ද, ආධාර ලබයි. විමුක්ති ආයතනයේ සමාරම්භකයෙකු වන 31 හැවිරිදි ගිගා බොකරියා, සෝරෝස් පදනම සංවිධානය කල සංචාරයකට එක්වෙමින් පසු ගිය පෙබරවාරියේ දී සර්බියාවට ගියේ, ඔට්පෝ හෙවත් "විරෝධතාවය" නමැති ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාරය විසින්, 2000 වසරේ පැවති මතභේදයට තුඩුදුන් මැතිවරනයෙන් පසුව යුගෝස්ලාවියානු නායක මිලොසෙවික් බලයෙන් පහකල ආකාරය පිලිබඳව අධ්‍යයනය කිරීමට ය.

මෙම වසරේ ග්‍රීෂ්මයේ දී ජෝර්ජියාවට පැමිනි ඔට්පෝ ක්‍රියාකාරීන්, රටපුරා සිසුන් දහසක් සම්බන්ධ

කර ගත් පුහුනු කිරීමේ වැඩමුලු පවත්වා සර්බියානු වර්ගයේ "විප්ලවයේ" ක්‍රමෝපායන් කියා දුන්හ. මෙහි ප්‍රතිඵල වසයෙන් මාස ගනනකට පසුව නොවැම්බර් 22-23 දිනවල සාකාෂ්විලිගේ සාර්ථක කුමන්ත්‍රනයකට අවශ්‍ය පිරිස් බලය සැපයූ ක්මාරා ශිෂ්‍ය සංවිධානය ආරම්භ විය.

ෂෙවඩ්නාඩ්සේ බලයෙන් පහ කිරීමට සම්බන්ධ වූ, තවත් එක්සත් ජනපද අවයවයක් වූයේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික උරුමය (එන්ඊඩී) යි. මෙය රේගන් පරිපාලනය යටතේ, ජාත්‍යන්තරව, කුමන්ත්‍රන හා කඩාකප්පල්කාරී ක්‍රියා සංවිධානය කල, ඒඑෆ්එල් හා සීඅයිඕ සංවිධානවල වෘත්තීය සමිති නිලධරයේ සේවය මත, දැඩි ලෙස රඳා පැවති මධ්‍යස්ථානයකි. ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නමින් හඳුනන එක්සත් ජනපද ඩිමොක්‍රටික් පක්ෂය තුල එන්ඊඩී කන්ඩායම, වෝල්ස්ට්‍රීට් ජර්නලයේ තීරු රචක ජෝර්ජ් මෙලොන්ගේ වචනවලින් "සර්බියාවේ ඒකාධිපති ස්ලොබොඩාන් මිලොසෙවික් බලයෙන් පහකිරීමට උපයෝගී කර ගත් ත්‍රස්තවාදී ක්‍රමෝපායන් සකාෂ්විලි මහතාට හඳුන්වා දීමට" ආධාර කලේ ය.

සකාෂ්විලි වොෂින්ටනය කෙරෙහි සිය ගැතිකම ප්‍රකාශ කිරීමට, නිර්ලජ්ජිතව ඉදිරිපත් විය. නුදුරු අනාගතයේ දී ජෝර්ජියාවේ ජනාධිපති වීමට නියමිත පුද්ගලයා, වාචිකව බුෂ්ගේ දෙපා මත වැටෙමින්, භූගෝලීයව ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාප්ත කිරීමට "කැපවීම" ගැන, බුෂ්, නොවැම්බර් 19 දින ලන්ඩනයේ දී කල කතාව වගවර්නනා කල තීරු ලිපියක් දෙසැම්බර් 2 දා *ෆිනෑන්ෂල් ටයිම්ස්*හි පලකලේය. "මෙම අභිවාදනයෙන් පසුව (කිසිදු දෘඪතර ඇඟවීමකින් තොරව) "රෝස විප්ලවය" වනාහි ජාතියක් වසයෙන් අපගේ ම මාවත තීරනය කිරීමේ අපේ අයිතිය බව ප්‍රකාශ විය."

මෙම තීරු ලිපිය තුල ව්‍යාපාරික කටයුතු දෙසට හැරුනු සකාෂ්විලී "නියම වෙලඳ පොල ආර්ථිකයකට" සිය සහාය පලකලේ ය. "අසර්බයිජාන්හි බාකු සිට ටිබිලිසි හරහා තුර්කියේ සීහාන් වරාය තෙක් දිවෙන" තෙල්නල පද්ධතිය "පැරනි සේද මාවත යලි පන ගැන්වීමට නො අඩු දෙයක්" ලෙසට හුවාදැක්වී ය.

## වොෂින්ටනයේ දෙබිඩි පිලිවෙත

කොකේසියාව තුල වොෂින්ටනයේ ප්‍රජාතන්ත්‍රීය රංගනයෙහි කුහකත්වය, එක්සත් ජනපදයෙන් පිටත සමහර විචාරකයන්, පෙන්වා දී තිබේ. එක් අතකින්, ජෝර්ජියානු පාර්ලිමේන්තු මැතිවරනය හෙලා දැකීම, හා ෂෙවඩ්නාඩ්සේ වෙත සිය සහයෝගය ඉවත් කර ගැනීමත්, අනෙක් අතින්, ඊට දින ගනනකට පෙර අසල්වැසි කෝකේසියානු අසර්බයිජානයේ පැවති, ප්‍රෝඩාකාරීත්වයෙන් නො අඩු මැතිවරනය පිලිබඳව, දක්වන නිහඬතාවත් අතර පවතින බුෂ් පරිපාලනයේ පරස්පරවිරෝධය ගැන නොවැම්බර් 27 දා *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රය සඳහන් කලේ ය.

"අසර්බයිජාන්හි, ස්වාධීන නිරීක්ෂකයන්ගේ ප්‍රබල විවේචන නො සලකා හල බුෂ් පරිපාලනය, ප්‍රථම පශ්චාත් සෝවියට් පාලක පෙලපත ස්ථාපිත කිරීමට සිය සහාය පල කලේ ය. නව ජනාධිපති ලෙස පත් වූ, ඉවත්ව යන ජනාධිපතිගේ පුත් අයිහැම් ඒලියෙව්ගේ ආරක්ෂක හමුදාවන්, විරුද්ධ පාක්ෂිකයන් අත් අඩංගුවට ගනිමින් තිබිය දීත්, ස්වාධීන නිරීක්ෂකයන් ඡන්දය විවේචනය කර තිබිය දීත්, (බුෂ් පරිපාලනය) වහා ම ඒලියෙව්ට සිය සුභ පැතුම් පිරිනැමී ය." යි පුවත්පතෙහි පල විය.

පුවත්පත මෙම වෙනස්වීම විස්තර කලේ මෙසේ ය: "(ජෝර්ජියාවේ) රුසියානු නැඹුරුව වොෂින්ටනය දැක ගත්" අතර ඊට හාත්පසින් වෙනස් ලෙස අසර්බයිජානයේ ඒලියෙව් පවුල "දැඩි ලෙස එක්සත් ජනපද හිතවාදී ලෙස දැක ගත්හ."

එක්සත් ජනපද පිලිවෙත ගැන මැදහත් අගැයීමක් සහිතව ලිපිය කියා සිටියේ "කෙසේ වුව ද, එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්තිය, හදිසියේ ම උසස් සදාචාර මූලධර්මයන්ගෙන් මෙහෙයවෙනවා ය යන්න, සැක සහිතය. වොෂින්ටන් විශ්ලේෂකයන්, ඒ වෙනුවට ඔවුන් දකින්නේ, කොකේසියානු සිද්ධීන් ඉස්ලාමීය සන්නද්ධ භටයන්ට එරෙහිව සටන් කිරීමේ අවශ්‍යතාවෙන් යුක්ත, මධ්‍යම ආසියාවේ ඒකාධිපතියන් බුෂ් පරිපාලනය වෙත යොමු කර ගැනීම සඳහා කලාපය තුල වගකීම් විරහිත ලෙස ක්‍රියාවට නැගූ එක්සත් ජනපදයේ නියම දේශපාලනය පිලිබඳව තවත් උදාහරනයක් ලෙසයි.

කෝකේසියාව තුල එක්සත් ජනපද ප්‍රතිපත්තිය අන්තයට ම සාහසිකවූ සූරාකෑමේ පිලිවෙතකි. බුෂ් පරිපාලනය, රුසියානු අවශ්‍යතාවන්ට අතිශය ප්‍රකෝපකාරී ආකාරයකට අභියෝග කරමින් පැරනි සෝවියට් සමූහාන්ඩු, මොස්කෝවෙන් භේද කිරීමට හා ප්‍රායෝගිකව ම ඇමරිකානු මිලිටරි කඳවුරුවලින් වටකිරීමට විවෘතව කටයුතු කරමින් සිටියි. ඇෆ්ගන් යුද්ධය සම්බන්ධ කර ගෙන, ඇමරිකානු හමුදා මධ්‍යස්ථාන පිහිටුවා ඇති කිර්ගිස්ථානය හා උස්බෙකිස්ථානය යන පැරනි සෝවියට් සමූහාන්ඩු තුල, එක්සත් ජනපද ස්ථිර යුද කඳවුරු පැවතීමට, මොස්කෝව විරුද්ධ වන බව රුසියානු ආරක්ෂක ඇමති සර්ගේ ඉවානෝව් ප්‍රකාශ කර ඇත්තේ යාන්තම් පසු ගිය මාසයේ ය.

ඒ අතර වාරයේ, වොෂින්ටනයේ ආක්‍රමනකාරී ක්‍රියාවන්, කෝකේසියාවේ හා ඉන් පිටත ද, පුපුරනසුලු වාර්ගික හා ආගමික ආතතීන් ඇවිලීයාමේ තර්ජනය මතුකරයි.

© www.wsws.org